# ශ්‍රී ලංකාවේ තේ අපනයන සමාගම්වල අපනයන කාර්ය සාධනය පිළිබඳ තත්ත්ව ප්‍රමිතීන්ගේ ඇඟවුම්

එම්. එච්. එන් ද සිල්වා[1] සහ එම්. ඉෂාම්[1]

[1]කෘෂි ව්‍යාපාර කළමනාකරණ අධ්‍යනාංශය, කෘෂිවිද්‍යාපීඨය, ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය, බෙලිහුල්ඔය.

විද්‍යුත් තැපැල( mhndesilva@gmail.com, esham@agri.sab.ac.lk

පරිවර්තනය - එම්.එච්.එන් ද සිල්වා

## හැඳින්වීම (Introduction)

මෙම අධ්‍යයනය මඟින් විවිධ ජාත්‍යන්තර වෙළඳපලවලට අවශ්‍ය තත්ත්ව ප්‍රමිතීන්ගේ ඇඟවුම් සහ එය ශ්‍රී ලංකාවේ තේ අපනයන සමාගම්වල ක්‍රියාකාරීත්වයට බලපාන ආකාරය හඳුනාගනී. පසුගිය දශක කිහිපය තළ ආහාර සුරක්ෂිතතා ගැටළු මතුවීම හේතුවෙන් පාරිභෝගිකයින් අතර ආහාර සුරක්ෂිතතාව පිළිබඳ දැනුවත්භාවය සහ සැලකිල්ල වැඩි වී තිබේ. මේ නිසා බොහෝ රටවල ආහාර සම්බන්ධයෙන් පවතින ප්‍රමිතීන් සහ රෙගුලාසි ශක්තිමත් වී ඇත. ආහාර සහ කෘෂිකාර්මික භාණ්ඩ පාලනය කරන රෙගුලාසි සහ වාණිජ අවශ්‍යතා වල මෙවන් වැඩිවන සංකීර්ණතා බොහෝ කෘෂි ආහාර කර්මාන්ත සඳහා වන අනුකූලතාවය අභියෝගයට ලක් කර ඇත. තේ කර්මාන්තය ශ්‍රී ලංකාව තුළ වැදගත් ස්ථානයක් හිමි කරගන්නා අතර ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ දැඩි ප්‍රමිතීන් සහ රෙගුලාසි මතුවීම හේතුවෙන් ශ්‍රී ලංකා තේ අපනයනකරුවන්ට විශාල අභියෝගයක් එල්ල වී තිබේ. තේ වල පාලන ප්‍රමිතීන්ට අනුකූල නොවීම හේතුවෙන් තොග ප්‍රතික්ෂේප කිරීම් කිහිපයක් ද මෑතක දී සිදු වී ඇත. මේ අනුව, මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ විවිධ වෙළඳපල ගමනාන්තවල තේ සඳහා ප්‍රමිතීන් හඳුනා ගැනීම සහ තේ අපනයන සමාගමක් විසින් සහතිකයක් ලබා ගැනීම ඔවුන්ගේ අපනයන ක්‍රියාකාරිත්වයට බලපාන ආකාරය හඳුනා ගැනීමයි. තවද එය ප්‍රමිතීන්ට අනුකූල වීමේ හැකියාව කෙරෙහි බලපාන ආයතනයට අදාළ සාධක හඳුනා ගනී.

## පර්යේෂණ ක්‍රමවේදය (Methodology)

මෙම අධ්‍යයනය මෙරට තේ අපනයන සමාගම් 39කගේ සම්බන්ධය ඇතිව ගුණාත්මක හා ප්‍රමාණාත්මක ප්‍රවේශයන් අනුගමනය කරමින් සිදු කරනු ලදී. සිද්ධි අධ්‍යයනය සඳහා මහා පරිමාණ තේ අපනයන සමාගම් හතරකින් සහ කුඩා හා මධ්‍ය පරිමාණ තේ අපනයන සමාගම් හතරකින් සමන්විත වූ සම්මුඛ සාකච්ඡා ඇතුළත් විය. අනෙකුත් තේ අපනයන සමාගම්වලින් දත්ත රැස් කිරීම සඳහා මාර්ගගත සමීක්ෂණයක් පවත්වා ඇත.

## ප්‍රතිඵලය විශ්ලේෂණය (Result and Discussion)

මෙම අධ්‍යයනය පහත ප්‍රධාන සොයාගැනීම් හෙළි කරයි. පළමුව, තේ සඳහා වන ප්‍රමිතීන් විවිධ රාජ්‍ය හා පෞද්ගලක ප්‍රමිතීන්ගෙන් සමන්විත සංකීර්ණ වේ. ජාත්‍යන්තර තේ වෙළඳාමේදී තේ අපනයන සමාගම් විසින් පොදු ස්වේච්ඡා ප්‍රමිතීන් අනුගමනය කිරීම පුද්ගලික ස්වේච්ඡා ප්‍රමිතීන් අනුගමනය කිරීමට වඩා ඉහළ වන

අතර එය අගයෙන් 65.7% ක් වේ. පුද්ගලික ස්වේච්ඡා ප්‍රමිතීන් අනුගමනය කිරීම 34.3% ක් වේ. මහජන ස්වේච්ඡා ප්‍රමිතීන් ලෙස ISO 22000, HACCP සහ GMP සහතික වැදගත් වන අතර ජාත්‍යන්තර තේ වෙළඳාමේ දී පුද්ගලික ස්වේච්ඡා ප්‍රමිතීන් ලෙස කාබනික, FSSC 22000 සහ BRC වැදගත් වේ. තේ අපනයන සමාගම් විසින් ආහාර තත්ත්ව සහ ආරක්ෂණ ප්‍රමිතීන්ට (Food Quality and Safety) අනුගත වීම 77% ක් වන අතර එය පරිසරය (Envionmental-20.5%) සහ සමාජීය (Social-2.5%) ප්‍රමිතීන්ට සාපේක්ෂව ඉහළ ය. විවිධ ජාත්‍යන්තර වෙළෙඳපොලවල් සලකා බැලීමේදී ජපානය, යුරෝපා සංගමය සහ ඇමරිකා එක්සත් ජනපදය තේ සඳහා දැඩි ප්‍රමිතීන් අනුගමනය කරයි. විශේෂයෙන් තේ වල ඇති පළිබෝධනාශක සඳහා වන MRL (උපරිම අවශේෂ මට්ටම්) අගය පළිබෝධනාශක වන MCPA (2-methyl-4-chlorophenoxyacetic acid) සහ Diuron (N-(3,4- dichlorophenyl)- N,N-dimethyl urea) සඳහා ජපන් වෙළඳපොල දැඩි වේ. යුරෝපා සංගම් වෙළෙඳපොල සමාජීය සහ පාරිසරික ගැටළු පිළිබඳව දැඩි සැලකිල්ලක් දක්වයි. මේ අනුව, තේ අපනයන සමාගමක් විසින් කාබනික (Organic), සාධාරණ වෙළඳාම(Fair Trade) හෝ වැසි වනාන්තර සන්ධානය (Rain Forest Alliances) වැනි සහතිකයක් ලබාගැනීම තරඟකාරී වාසියකි. සාමාන්‍යයෙන් මැද පෙරදිග ගැනුම්කරුවන් ප්‍රමිතීන් ගැන වැඩි සැලකිල්ලක් නොදක්වයි. දෙවනුව, සමාගම් විසින් අනුගමනය කරන ලද සහතික සංඛ්‍යාව සහ වෙළඳපල ගමනාන්ත සංඛ්‍යාව අනුව මනිනු ලබන ඔවුන්ගේ අපනයන කාර්ය සාධනය අතර ඉහළ සහසම්බන්ධයක් ඇති බව අනාවරණය කළේය. තෙවනුවල සමාගම්වල ප්‍රමාණය හෝ සමාගම්වල පළපුරුද්ද මත නොව මූල්‍ය සහ කළමනාකරණ හැකියාවන් ඇති සමාගම් ප්‍රමිතීන්ට අනුකූල වීමට වැඩි ඉඩක් ඇති බව මෙහිදී අනාවරණය විය. හතරවනුව, තේ අපනයන සමාගම් ප්‍රමිතීන්ට අනුකූල නොවී වෙළඳපලින් ඉවත් වීම හෝ ප්‍රමිතීන් අභියෝගයට ලක් කිරීමට වඩා නැගී එන ප්‍රමිතීන්ට අනුකූල වීම වැනි උපාය මාර්ගයක් අනුගමනය කිරීම වැඩි බව අනාවරණය විය.

## නිගමන (Conclusions)

තේ වල වර්ධනය වන ප්‍රමිතීන් හේතුවෙන් ශ්‍රී ලංකාවේ රජය සහ වගකිවයුතු ආයතන තේ අපනයන සමාගම්වලට ප්‍රමිති අභියෝගවලට මුහුණ දීමට සහ ගෝලීය වෙළෙඳපොළ තුළ ලංකා තේ සඳහා ඇති ස්ථානය සහතික කිරීමට අවශ්‍ය අනිවාර්ය සහයෝගය ලබා දිය යුතුය. තවද ඉහල දැනුවත්භාවය සහ ජාත්‍යන්තර වෙළෙඳපොළට අනුකූල වන පරිදි අපනයන සමාගම්වල ධාරිතාව සහ යටිතල පහසුකම් ගොඩනැඟීම ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ලංකාවේ තේ වල තරඟකාරිත්වය ඉහල නැංවීමට අවශ්‍ය අත්‍යවශ්‍ය සාධක වේ.

## පරිශීලන කෘති (Referances)

Chen, M., Otuski, T., & Wilson, J. (2006). Do Standards Matter for Export Success? *World bank Policy Research Working Paper*.

Hammoudi, A., Hoffman, R., & Surry, Y. (2009). Food safety standards and agri-food supply chains:Ab introductory overview. *European Review of Agricultural Economics*, 469-478.

Ismail, M., & Mohamed, K. (2013). International tea marketing and need for reviving Sri lankan tea industry. *Journal of Management*.

Wiiyayasiri, J., & Jayaratne, S. (2011). Implications of agri-food standards for Sri Lanka:Case studies of tea and fisheries export industries. *Asia-Pacific Research and Training Network on Trade Paper Series*.

Wijayasiri, J. (2013). Food standards and governance in the tea industry in Sri Lanka: A value chain analysis. *sementicsholar*.